පිළිතුරු පත්‍රය

සිංහල 13 ශ්‍රේණිය

II පත්‍රය

I කොටස

ලකුණු දීමේ පටිපාටිය

01.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| (01) | 5 | (11) | 4 |
| (02) | 3 | (12) | 3 |
| (03) | 4 | (13) | 2 |
| (04) | 2 | (14) | 5 |
| (05) | 1 | (15) | 3 |
| (06) | 3 | (16) | 1 |
| (07) | 4 | (17) | 4 |
| (08) | 2 | (18) | 3 |
| (09) | 5 | (19) | 5 |
| (10) | 1 | (20) | 1 |

ලකුණු 1X20

II කොටස

2. (අ)

I. පද්‍ය කාව්‍ය - කව්සිළුමිණ,කාව්‍යශේඛරාදී
ගද්‍ය කාව්‍ය - අමා වතුර,බුත්සරණ
දෘෂ්‍ය කාව්‍ය - මනමේ,සිංහබාහු
චම්පු කාව්‍ය - සංස්කෘත භාෂාවෙන් රචිත දමයන්ති ආදී කතා

II. දෘෂ්‍ය කාව්‍ය.

III. ගීත ප්‍රබන්ධ, ගීත නිබන්ධ, ගී රචනා කී විට ස්වර ගීත ද ඊට ඇතුළත් වන බැවිනි.

IV. එහි කතෘවරයා සංගීතඥයාමය.
ඒවා ලියා දක්වන්නේ සංගීතයට ආවේණික වූ භාෂාවකිනි, සංකේත මාලාවකිනි, ස්වර ප්‍රස්තාර වලිනි.

V. ශබ්ද රසය මුල් වීම , රාගයක් අනුව විධිමත් ලෙස නිමවනු ලැබීම, ස්වර රචනාවක් මත පිහිටා ගැයීමට හැකිවීම.

VI. කව් සිළුමිණ, කාව්‍යශේඛරය

(ලකුණු 2*12)

(ආ).පහත කරුණු සාරාංශයේ අන්තර්ගත විය යුතුය.

- සිසුන් තුළ ආත්ම ශක්තිය සහ ආත්ම විශ්වාසය රෝපණය කිරීමත් පෞරුෂය වර්ධනයත් නවීන අධ්‍යාපනයේ අරමුණුය.
- ඒ සඳහා සාහිත්‍යයෙන් මහත් පිටිවහලක් ලැබේ.
- සමාජය, පංතිය, දේශය,ඉක්මවා පරිකල්පනය විහිදුවාලීමටත්,පුද්ගල ප්‍රශ්න මානුෂික අත්දැකීම්හි අංශු මාත්‍රයක් බව ඒත්තු ගැන්වීමට සාහිත්‍ය අධ්‍යයනය හේතු වේ.
- සාහිත්‍ය කෘති පරිශීලනයෙන් ස්වකීය අනන්‍යතාව සාක්ෂාත් කරගැනීමටත් සමාජය පිළිබඳව පුළුල් දැක්මකින් කටයුතු කිරීමටත් ඉඩ සැලසේ.
- ඉහත කරුණු ඇතුළත්ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතුය. වචන 75-85 අතර
- සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට -ලකුණු 02
  භාෂා නිරවද්‍යතාවට -03
  අන්තර්ගතයට -08

(ලකුණු 13

03.වාක්‍ය රචනයට ලකුණු දීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසුය.

I. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
II. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
III. කරුණුවල පැහැදිලි බව
IV. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම.
V. ව්‍යාකරණ දෝෂ රහිත වීම
VI. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.
VII. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
VIII. කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම.

(ලකුණු 25)

4. (අ)

I. ඩෙංගු රෝගීහු රෝහල් ගත කරනු ලැබූහ./ලදහ.
II. වැස්සට බල්ලාද , බයිසිකලයි ද, කබායද, තෙමෙති.
III. ළමයි ගුරුවරියක්ගේ ඇඳුම් විවේචනය කරති.
IV. තව මොහොතකින් ළමයින් ගී ගයනු ඇත.
V. දරුවන් ඉගෙන ගනිති'යි දෙමාපියෝ විශ්වාස කරති.

(ලකුණු 1*5=5)

(ආ).

I. කැරලි කරුවන් විසින් නායකයෝ අපහසුතාවට ලක් කරනු ලබත් / ලබති / ලක් කෙරෙති.
II. ආදී ශිෂ්‍යන් විසින් ආදරයෙන් මම පිළිගනු ලැබීමි/ලදිමි.
III. වන අලින් විසින් අසරණ ගම්මුන්ගේ වගාවන් විනාශ කෙරෙයි/ කරනු ලැබෙයි.
IV. ජනපතිතුමා විසින් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනෙහි අරමුණ පැහැදිලි කරන ලදී.
V. නිළියක විසින් ප්‍රේක්ෂකයෝ කුල්මත් කරන ලදහ / ලැබු හ

(ලකුණු 1*5=5)

(ඉ).

I.යමෙක්/ සිතන්නෙක්
II. පුරවැසියන් / මෝඩයන්
III. රචකයෙකු / විචාරකයෙක්
IV. අප / කරති
V. මිනිස්සු / යුත්තෝය

(ලකුණු 1*5=5)

5.ව්‍යාකරණ අනු අංග දැක්වීම

| අදාල පදය | ප්‍රධාන අංගය | අනු අංගය |
|---|---|---|
| (I)පන්සිල් | විශේෂණ සමාස | සංඛ්‍යා පූර්ව විශේෂණ සමාස |
| සුපිපි | උපසර්ග | අර්ථය උද්දීපනය කිරීමේ උපසර්ග |
| බඳු | නිපාත | උපමාවාචී නිපාත පද |
| (II) ගුරුතුමා | සන්ධි | පරස්වර ලෝප සන්ධිය |
| සෙනෙහසින් | තද්ධිත | ස්වාර්ථයේ තද්ධිත |
| ගෝලයන් | විභක්ති | කර්ම විභක්ති / කම් විහත |
| (III) අධිරජ | උපසර්ග | අර්ථය දීප්තිමත් කරයි |
| කේෂාන්තයේ | සන්ධි | ස්වරාදේශ සන්ධි |

| | | |
|---|---|---|
| දක්වා | නිපාත | සීමාර්ථයේ නිපාත |
| (IV) ඇගේ | විභක්ති | සම්බන්ධ විභක්ති |
| දුටු | කෘදන්ත | අතීතකාල කෘදන්ත පදයකි |
| ගං ඉවුර | සන්ධි | ග්‍රාත්‍රාක්ෂර ලෝප සන්ධියකි |
| (V) හිරුසඳු | සමාස | දකාරාර්ථ සමාස |
| තුරු | නිපාත | සීමාර්ථයේ නිපාත |

(ලකුණු 5*5=15)

ප්‍රශ්න අංක 06

I. උළෙල
II. මනුෂ්‍ය
III. උවදුරු
IV. උත්සවය
V. උපද්‍රව
VI. මිනිස්

(ලකුණු 1/2 *6=3)

06(ආ)

I. එකින් + එක
II. විදේශ + ආධාර
III. වි + අවුල්
IV. ළිප් + ගල
V. මිහිඳු + තලය
VI. රුක් + පා

(ලකුණු 1/2 *6=3)

( ඉ)

(I) ගමින් - අවධි විභක්ති
ගමට - සම්ප්‍රදාන විභක්ති

(II) පුතුනේ - ආලපන විභක්ති
අපේ -සම්බන්ධ විභක්ති

(III) අක්කා - ප්‍රථමා විභක්ති
කෙක්කෙන් - කරණ විභක්ති

(ලකුණු 1/2 *6=3)

(ඊ). ඔහු මොහොතක් කල්පනා කළේය. අනතුරුව කතා කරන්න පටන් ගත්තේය. "පිස්සු කතා කරනවද?, එයා හරි දක්ෂයි. අද එයා පන්තියක් කරනවා" "ආ ! එහෙමද? කොහෙද පන්තිය තියෙන්නෙ? මටත් ආසයි බලන්න."

(ලකුණු 1/2 *6=3)

(උ)

I. තමා පෙරදින දළදා වඳින්න ගිය බව තාත්තා කීවේය.
II. ඒ දානය දුන් පිනෙන් තමා මතු ආත්මයේදී මහත් ධන ඇතිව ඉපදෙන ලෙස උපාසිකාව ප්‍රාර්ථනා කළාය.
III. හංසනී සිය මව අමතා තමා විභාගය සමත් වී ඇති බව කියා මව වැළඳ ගත්තාය.

(ලකුණු 1 *3=3)

7 .

I. උම්මග්ග ජාතකය, දඹදෙණි අස්න, දළදා පූජාවලිය, දළදා සිරිත, පන්සිය පනස් ජාතක පොත, සිංහල අනාගත වංශය, සිංහල බෝධි වංශය

(ලකුණු1*3= 3)

II. ජීවිත + අවබෝධයට
සමාජ + උන්නතියට
පර + ආක්‍රම

(ලකුණු1*3= 3)

III. (අ) ගත්හ
(ආ) උගතුන්/රජවරුන්
(ඉ) රජවරු

(ලකුණු1*3= 3)

(IV) කෘතිහු - ගැටය සහිත ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි කොන් පාපිල්ල
ප්‍රමාණවත් - රකාරාංශය, ඇලපිල්ල, හල් කිරීම ( කොඩිය)
කුරුණෑගල- පාපිල්ල, පාපිල්ල, දික් ඇදපිල්ල

(ලකුණු1*3= 3)

(V) සනානන්ද

(ලකුණු1*3= 3)
(ලකුණු3*5= 15)

8. ස්වරාදේශ සන්ධිය

සන්ධිවන දෙපදයේ මුල හා අග ඇති ස්වර දෙක වෙනුවට එක් ස්වරයක් ආදේශ වීමෙන් මේ සන්ධිය සිදු කෙරේ. ආදේශ වන ස්වර මෙසේය.

අ + ඉ දෙකට එ ස්වරය
ඉ + අ ඒ
අ + උ ඔ
උ + අ ඕ
එ + අ ඇ
නිදසුන්

දැත
දෙ + අත

ද් + එ + අත

ද් + ඇ

දැත

ග්‍රාමෝදය

ග්‍රාම+ උදය

ග්‍රාම් + අ + උදය

ඕ

ග්‍රාමෝදය

සහෝදර

සහ + උදර

සහ් + අ + උදර

ඕ

සහෝදර

(II) අන්‍යාර්ථ සමාස

නාම ප්‍රකෘති (හෙවත් නාම ශබ්ද) කීපයක් එකට කැටි වීමෙන් සෑදෙන වචනයේ අර්ථයට වඩා වෙනස් අරුතක් ගම්‍යමාන වන සමාස පද අන් අරුත් සමස් නමින් හැඳින්වේ. සියපත් යන වචනයෙන් හැඟවෙන්නේ නෙළුම්ය. සියපත් යන වචනයේ නෙළුම් යන තේරුම නැත. එහෙත් එය එම තේරුම ගෙන දෙනු පිණිස යෙදේ. මෙය අන්‍යාර්ථ සමාස නම් වේ. නිද - තිනෙත්

නෙත් තුනක් ඇත්තේ යමෙකුටද හෙතෙම තිනෙත් නම් වේ. එහි තේරුම ඇස් තුනක් ඇත්තා යන්නය. එහෙත් තිනෙත් යැයි ව්‍යවහාර කෙරෙන්නේ ඊශ්වරයාටය.

සඳවත

සඳවැනි මුහුණක් ඇති තැනැත්තියට සඳවත යැයි කියනු ලැබේ. එහෙත් සඳවත යැයි කියනු ලබන්නේ කාන්තාවටය. මෙවැනි තවත් පද සමුදායක් ඇති අතර දසබල, සහෝදර , සුන්තුරු, සහසැස් ආදී වචන ඉන් කිහිපයකි

(III).අසම්භාව්‍ය ක්‍රියා

අනියමාර්ථයක් හෝ කාලාර්ථයක් හෝ ප්‍රකාශ කරන්නේ නම් එය මේ නමින් හැඳින්වේ. මෙම ක්‍රියාවෙහි විශේෂත්වය නම් කාල භේදයක් හෝ පුරුෂ භේදයක් හෝ නොතිබීමය. මෙය කාලාර්ථයේ හා අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා නමින් ද්විවිධ වේ.

නිදසුන්: 01.කියත උන් මෙතෙපල - ආයෙය ඇඳුරු ගුත්තිල

02.මා පරිසරය නරඹමින් සිටිත වන අලි රංචුව ඇතින් දිස් විය.

03.සොරුන් ගෙට ඇතුළු වෙද්දී අපි රූපවාහිනිය නරඹමින් සිටියෙමු.

ඉහත වාක්‍යවල

- කියත - කියද්දී (කියන කල්හි)
- සිටිත- සිටිද්දී ( සිටින කල්හි)
- වෙද්දී - වෙද්දී( වෙන කල්හි)

ඉහත දැක්වෙන වැනි කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා හඟවයි. කියත, සිටිත, වෙද්දී, වැනි පද එම අරුත ගෙන දෙයි.

- වැසි වැටුණොත් ඒ සොඳුරු මොහොත් අඳුරුවේ සැණෙකින්
- දොළ ගැලුවොත් හෙට උදේට කොහොමද ඉස්කෝලේ යන්නේ.

- මෙම වාක්‍ය අනියමාර්ථය අඟවයි. එනම් සොඳුරු මොහොත

අඳුරු වන්නේ වැසි වැටුණොත් පමණි. එය ස්ථිර නැත. සිදු වීමට හෝ නොවීමට ඉඩ ඇත.(කාලය පිළිබඳ අනියමාර්ථය මෙයින් ධ්වනිත වේ)

(IV). භාවාර්ථ නිපාත

හාව යනු හැඟීමිය. ඒ අනුව භාවාර්ථ නිපාත යනු කිසියම් හැඟීමක් හඟවන්නා වූ නිපාතයි. හැඟීම් වල ස්වභාවයද විවිධය. දුක, වේදනාව, විස්මය ආදී හැඟීම් ඉන් කීපයකි. හැඟීම්වල ස්වභාවය අනුව ප්‍රභේද හතරකි. එනම්

- ඛේදාර්ථ (විපතක් හැඟවීම)
- වේදනාර්ථ (වේදනාවක් හැඟවීම )
- විස්මයාර්ථ( විස්මය හැඟීමක් දැනවීම)
- කුක්සිතාර්ථ - (පිළිකුලක් හැඟවීම) වශයෙනි
- ඛේදාර්ථ - අනේ, අපොයි, අයියෝ, ඇඳෝ
  අනේ ! මගෙ අතින් ඒක බිඳුණා.
  අපොයි ! දෙයියනේ
- වේදනාර්ථ- ඇයි , ඌයි
  ඌයි ...මට රිදුණා
- විස්මයාර්ථ - ආ, ඔහෝ , ආහා, හා, හහා
  ඔහෝ! මේ ඒ රන් පිහානද ?
- කුක්සි තාර්ථ- චී, සීසී, ච්: ! චිතරක් ඒකෙ කැත

(V) අනම්‍යකරණය

සිංහල භාෂාවේ නම්‍ය ස්වර තුනකි. ඒවා නම් 'අ, උ, ඔ, යන ස්වරයි. " සුදුසු තන්හි නැවෙන හෙයින් නම්‍ය නාමය යෙදේ" මේවා අනම්‍ය ස්වර බවට පත් වන්නේ ' ඇ, ඉ, එ, යන ලෙසටය.

ඒ අනුව

අ > ඇ

උ > ඉ

ඔ > එ

- 1. නිදසුන් - 'අ' වර්ණ - ඇ වර්ණවීම
  මහලු- මැහැලි
  බල්ලා- බැල්ලී
  බලයි- බැලෙයි
  පාරයි- පැරෙයි
2. 'උ' වර්ණ - 'ඉ' වර්ණ වීම
  උකුණු - ඉකිණි
  වඳුරු- වැඳිරි
  උතුරයි- ඉතිරෙයි
3. 'ඔ' වර්ණ - 'එ' වර්ණ වීම
  කොලු- කෙලි
  සොර- සෙර
  සෝදයි- සේදෙයි ආදී වශයෙන්

මෙහි හැඳින්වීමට ලකුණු 3

ලකුණු 5 බැගින් මුළු ලකුණු 3*5=15